බුද්ධශාසන අමාත්‍යාංශය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

13ෟ414

ශ්‍රී බු. ව. 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

9 ශ්‍රේණිය

විභාග අංකය :

කාලය පැය 01 විනාඩි 30 යි.

---

**(i)** කොටසේ සහ **(iii)** කොටසේ ප්‍රශ්න සියල්ලටත්

**(ii)** කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න තුනකටත් පමණක් පිළිතුරු සපයන්න.

**(i)** කොටසට ලකුණු 40 කි. **(ii)** හා **(iii)** කොටස් සඳහා ලකුණු (15×04) 60 කි.

## I කොටස

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ..........." යන ගාථාවෙහි සඳහන් වන දහම් ගුණ ගණන කීය ද?
   (i) 08 කි. (ii) 06 කි.
   (iii) 09 කි. (iv) 12 කි.

02. බුදුරජාණන් වහන්සේ අවසන් වස්කාලය ගතකළ ස්ථානය මින් කුමක් ද ?
   (i) සැවැත්නුවර (ii) බරණැස ඉසිපතනය
   (iii) බේලුව නම් ගම (iv) වේළුවනාරාමය

03. සප්ත අපරිහානීය ධර්ම ආරක්ෂා වූයේ කිනම් රාජ්‍යයේ ද ?
   (i) ලිච්ඡවි රාජ්‍යයේ ය. (ii) මගධ රාජ්‍යයේ ය.
   (iii) කෝසල රාජ්‍යයේ ය. (iv) වජ්ජි රාජ්‍යයේ ය.

04. සතර සෘද්ධිපාද යනු..........
   (i) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතා ය. (ii) මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා ය.
   (iii) ඡන්ද, චිත්ත, විරිය, විමංසා ය. (iv) පඨවි, ආපෝ, තේජෝ, වායෝ ය.

05. බුද්ධ පරිනිර්වාණය ආසන්නව තිබිය දී, බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටියදීම රහත් ඵලයට පත්වෙමැයි තිර අදිටනින් යුතුව භාවනාවෙහි නිරත වූ භික්ෂූන් වහන්සේගේ නම කුමක් ද ?
   (i) ආනන්ද හිමි (ii) ධම්මාරාම හිමි
   (iii) ඡන්න හිමි (iv) සුභද්‍ර හිමි

06. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට "සතර මහා පදේස" දේශනා කළේ කිනම් ස්ථානයේ දී ද ?
   (i) අම්බ ග්‍රාමයේ දී ය. (ii) හත්ථි ග්‍රාමයේ දී ය.
   (iii) පාවා නුවර දී ය. (iv) භෝග නගරයේ දී ය.

07. සුජාතාවගේ කිරිපිඬු දානය හා සමාන ආනිසංස ඇති දනයක් ලෙස බුදුරජාණන් වහන්සේ සඳහන් කළේ මින් කුමන දානය ද ?
   (i) අනේපිඬු සිටුවරයාගේ ආවාස දානය යි. (ii) ජීවකගේ කසී සළු දානය යි.
   (iii) චුන්ද කර්මාරපුත්‍රයාගේ සූකරමද්දව දානය යි. (iv) කොසොල් රජුගේ අසදෘශ මහා දානය යි.

08. පළමුවෙන් ම තම දරුවන්ට හොඳ නරක කියා දී යහමගට යොමු කරවන හෙයින් දෙමව්පියෝ මේ නමි හඳුන්වති.
   (i) පුබ්බ දේව (ii) ආහුනෙය්‍ය
   (iii) පුබ්බාචරිය (iv) බ්‍රහ්ම

09. ආහාරපාන, ඇඳුම්, උපකරණ, නිවාස ආදී තමන්ට අයත් බාහිර දේ පරිත්‍යාග කිරීම..........

(i) ආමිස දානය යි.  (ii) ධර්ම දානය යි.
(iii) ශ්‍රම දානය යි.  (iv) අභය දානය යි.

10. බුද්ධත්වය අරමුණු කරගෙන නුවණ දියුණු කරගැනීම..........

(i) දාන පාරමිතාව යි.  (ii) සීල පාරමිතාව යි.
(iii) ඛන්ති පාරමිතාව යි.  (iv) ප්‍රඥා පාරමිතාව යි.

11. දුර්භික්ෂ, රෝග හා අමනුෂ්‍ය යන තුන්බිය දුරුකර ගැනීම සඳහා දේශනා කරන ලද සූත්‍රය මින් කුමක් ද?

(i) කරණීය මෙත්ත සූත්‍රය  (ii) රතන සූත්‍රය
(iii) ආටානාටිය සූත්‍රය  (iv) මහා සමය සූත්‍රය

12. ආර්ය සත්‍ය මනාකොට දුටු සත්පුරුෂ සංඝයාගේ අකම්ප්‍ය ගුණය උපමා කොට ඇත්තේ මින් කුමකට ද ?

(i) මහා සාගරයට ය.  (ii) මහා පෘථිවියට ය.
(iii) ඉන්ද්‍රඛීලයට ය.  (iv) මහා මේරු පර්වතයට ය.

13. නිදි වර්ජිතව භාවනාවෙහි නිරත වීම නිසා රහත් ඵලයට පත්වන විට දෑස් අඳවූයේ කිනම් තෙරුන්ගේ ද ?

(i) සුණක්ඛත්ත තෙරුන්ගේ ය.  (ii) ධම්මාරාම තෙරුන්ගේ ය.
(iii) ලකුණ්ඨක භද්දිය තෙරුන්ගේ ය.  (iv) චක්ඛුපාල තෙරුන්ගේ ය.

14. අට ලෝ දහමෙහි ඇති පොදු ලක්ෂණය මින් කුමක් ද ?

(i) අනිත්‍ය ලක්ෂණය  (ii) සුඛ ලක්ෂණය
(iii) අනාත්ම ලක්ෂණය  (iv) නිත්‍ය ලක්ෂණය

15. පොළොන්නරු කතිකාවත සකස් වූයේ කිනම් රාජ්‍ය සමයේ දී ද ?

(i) පළමුවන විජයබාහු රාජ්‍ය සමයේ දී ය.  (ii) මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී ය.
(iii) නිශ්ශංක මල්ල රාජ්‍ය සමයේ දී ය.  (iv) ලීලාවතී රැජිනගේ රාජ්‍ය සමයේ දී ය.

16. "උද්දේසික චෛත්‍යය" යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද ?

(i) චෛත්‍යය ය.  (ii) ධාතු කරඬුව ය.
(iii) බුද්ධ ප්‍රතිමාව ය.  (iv) බෝධීන් වහන්සේ ය.

17. මහින්දාගමනය සිදුවූයේ බුද්ධ වර්ෂයෙන් කීවැන්නෙහි ද ?

(i) 226 වැන්නෙහි ය.  (ii) 256 වැන්නෙහි ය.
(iii) 246 වැන්නෙහි ය.  (iv) 236 වැන්නෙහි ය.

18. අගෝස්තු මස තුන්වැනි දින අප සමරන්නේ මින් කිනම් දිනය ද ?

(i) මිහිකත දිනය  (ii) දහම් පාසල් දිනය
(iii) ලෝක ළමා දිනය  (iv) අනගාරික ධර්මපාල දිනය

19. ශ්‍රී ලාංකික භික්ෂු පරපුර මෙරට බිහි වූයේ..........

(i) භණ්ඩුක උපාසකගේ පැවිද්දීමෙනි.  (ii) අනුලා දේවියගේ පැවිද්දීමෙනි.
(iii) මහින්දාගමනයෙනි.  (iv) අරිට්ඨ ඇමතිගේ පැවිද්දීමෙනි.

20. "ස්වාමීනි, මට අඹවලින් ඵලක් නැත, මට පිහිටවනු මැනව" යි බුදුරජාණන් වහන්සේගෙන් අයැද සිටියේ කවු ද ?

(i) පටාචාරාව යි.  (ii) සෝපාක යි.
(iii) කිසා ගෝතමිය යි.  (iv) චිංචි මානවිකාව යි.

(ලකුණු 02 x 20 = 40)

## II කොටස

01. (i) යථාවාදී තථාකාරී ගුණය කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 05)

(ii) සමානාත්මතාවය යනු කුමක්දැයි හඳුන්වා බුද්ධ චරිතයෙහි එම ගුණය පිළිබිඹු වූ අවස්ථා 04ක් සඳහන් කරන්න. (ලකුණු 10)

02. (i) අනුබුදු මිහිඳු මාහිමි චරිතයෙන් අපේ දිවියට ලද හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලාංකේය බුදු සසුනේ උන්නතිය උදෙසා අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ විසින් සිදුකළ මෙහෙය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10)

03. (i) දම්සක් පැවතුම් සූත්‍රයේ දුක්ඛ නිරෝධය හෙවත් දුකින් මිදීම කරුණු පහක් මගින් විස්තර වේ. එම කරුණු පහ නම් කරන්න. (ලකුණු 05)

(ii) අට ලෝ දහම නම් කර කෙටියෙන් හඳුන්වා, බුදුරජාණන් වහන්සේට අට ලෝ දහමට මුහුණ දීමට සිදු වූ අවස්ථා හතරක් සඳහන් කරන්න. (ලකුණු 10)

04. (i) අනුරාධපුර යුගයේ අවසාන භාගය වනවිට මෙරට බුදුසසුන කෙබඳු තත්ත්වයක පැවතියේ ද ?

(ලකුණු 05)

(ii) පළමුවන විජයබාහු රජතුමා සහ මහා පරාක්‍රමබාහු රජතුමා බුදුසසුනේ උන්නතිය උදෙසා ගත් ක්‍රියාමාර්ග පහ බැගින් ලියන්න. (ලකුණු 10)

05. (i) ත්‍රිවිධ චෛත්‍ය නම්කර බෝධීන් වහන්සේ වන්දනා කරන ගාථාවක් ලියන්න. (ලකුණු 05)

(ii) විහාරස්ථානය සහ ගම අතර සම්බන්ධතාවය වැඩි දියුණු කරගැනීම සඳහා උපකාර වෙතැයි ඔබට සිතෙන අර්ථවත් යෝජනා පහක් ලියන්න. (ලකුණු 10)

## III කොටස

06. (i) සිංහලයට නගන්න.

(i) ඔකාස අහං භන්තේ තිසරණේන සද්ධිං පංචසීලං ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ

(ii) භගවතා ධම්මෝ ස්වාක්ඛාතෝ, සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි

(ලකුණු 05)

(ii) පාලියට නගන්න.

(i) අවසර ස්වාමීනි, මම තිසරණ සහිත අෂ්ටාංග සීලය ඉල්ලමි.

(ii) ස්වාමීනි, ඔබ වහන්සේ මට අනුග්‍රහ කොට සිල් දෙන්න.

(iii) ස්වාමීනි, අපි දස සිල් ඉල්ලමු.

(iv) ධර්මය තමාගේ සිතට පමුණුවා ගැනීමට සුදුසු ය.

(v) භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය නුවණැත්තන් විසින් දත යුතුය.

(ලකුණු 02 x 05 = 10)

## බුද්ධශාසන අමාත්‍යාංශය - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

## ශ්‍රී.බු.ව 2564 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2020

### 09 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

(I) කොටසේ සහ (III) කොටසේ ප්‍රශ්න සියල්ලටත්

(II) කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න තුනකටත් පමණක් පිළිතුරු සපයන්න.

(I) කොටසට ලකුණු 40 කි. (II) හා (III) කොටස් සඳහා ලකුණු (15 × 04) 60 කි.

මූලාශ්‍රය - 09 ශ්‍රේණිය පොළ පොත

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | පිටු අංකය | ඡේදය/ ගාථාව/ පාඨය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | (II) 06 කි. | 03 | 02 | 02 |
| 02 | (III) බෙලුව නම් ගමේ ය. | 05 | 01 | 02 |
| 03 | (I) ලිච්ඡවී රාජ්‍යයේ ය. | 09 | 02 | 02 |
| 04 | (III) ඡන්ද, චිත්ත, විරිය, විමංසා ය. | 10 | 03 | 02 |
| 05 | (II) ධම්මාරාම හිමි | 10 | 02 | 02 |
| 06 | (IV) භෝග නගරයේදී ය. | 11 | 02 | 02 |
| 07 | (III) චුන්ද කර්මාරපුත්‍රගේ සූකරමද්දව දානය | 11 | 02 | 02 |
| 08 | (III) පුබ්බාචරිය | 20 | 03 | 02 |
| 09 | (I) ආමිස දානය යි. | 26 | 04 | 02 |
| 10 | (IV) ප්‍රඥා පාරමිතාව යි. | 27 | 03 | 02 |
| 11 | (II) රතන සූත්‍රය | 30 | 02 | 02 |
| 12 | (III) ඉන්ද්‍රඛිලයට ය. | 34 | 06 | 02 |
| 13 | (IV) චක්ඛුපාල තෙරුන්ගේ ය. | 41 | 02 | 02 |
| 14 | (I) අනිත්‍ය ලක්ෂණය | 46 | 01 | 02 |
| 15 | (II) මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේදී ය. | 52 | 02 | 02 |
| 16 | (III) බුද්ධ ප්‍රතිමාව ය. | 56 | 03 | 02 |
| 17 | (IV) 236 වැන්නෙහි ය. | 65 | 02 | 02 |
| 18 | (II) දහම් පාසල් දිනය | - | - | 02 |
| 19 | (IV) අරිට්ඨ ඇමතිගේ පැවිදිවීමෙනි. | 67 | 01 | 02 |
| 20 | (III)කිසාගෝතමිය. | 72 | 02 | 02 |

### II - කොටස

| ප්‍රශ්න අංකය | | පිළිතුර | පිටු අංකය | ඡේදය/ ගාථාව/ පාඨය |
|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | (I) | දේශනා කරන ආකාරයට ක්‍රියා කිරීමත් ක්‍රියා කරන ආකාරයට දේශනා කිරීමත් යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී ගුණය යි. අනුන් නොරැවටීම හා දේශනා කළ දේ එලෙසින් ම ඉටුකිරීම බුදුවරුන්ගේ චරිත ලක්ෂණය යි.<br>ඊට නිදසුන් ලෙස<br>ප්‍රථම ධර්ම දූත පිරිස චාරිකාවෙහි යොදවා තමන් වහන්සේ ද ධර්ම චාරිකාවෙහි යෙදීම.<br>අන් අයට මව්පිය උපස්ථානයේ අගය දේශනා කර තමන් වහන්සේ ද මව්පිය උපස්ථානය සිදු කිරීම<br>තමන් වහන්සේම ගිලානෝපස්ථානය කිරීම<br>නොයෙක් අයගේ දොස් පරොස් ඉවසා ඉවසීමේ අගය ලොවට පෙන්වීම.<br>පොරොන්දු කඩ නොකොට ආරක්ෂා කිරීම<br>*(මෙම කරුණු කියැවෙන ආකාරයේ පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 05 ක් ලබා දෙන්න)* | 74 | 1-5 | 05 |
| | (II) | සියලු දෙනාට සමානව සැලකීම. ජාති, කුල, පක්ෂ, උස් පහත් භේද ප්‍රතික්ෂේප කිරීම.<br>i. දේවදත්තටත්, අංගුලිමාලටත්, ධනපාල හස්තියාටත්, රාහුල කුමාරයාටත් එක හා සමාන ලෙස මෛත්‍රිය පැතිරවීම.<br>ii. උස් පහත් භේද නොසලකා ගෙපිළිවෙළින් පිණ්ඩපාතයෙහි වැඩීම<br>iii. සිව්වනක් පිරිසට තනතුරු පිරිනැමීමේදී උස් පහත් බව නොසලකා දක්ෂතාවය අනුව සුදුස්සාට සුදුසු තැන දීම.<br>iv. කවර ජාතියකට අයත් වූවත් බුදුසසුනේ පැවිදි වූ විට එකම ශාක්‍ය පුත්‍රීය ශ්‍රමණ නාමයෙන් ශ්‍රාවකයන් හැඳින්වීම.<br>v. සමාජය විසින් පහත් තත්ත්වයකට පත්කර සිටි කාන්තාවට සමාජයේ සම තැන ලබාදීම<br>*(හඳුන්වා උදාහරණ හතරක් ද දක්වා ඇත්නම් ලකුණු 10 ක් ලබාදෙන්න)* | 75<br>76 | 3-6<br>1-2 | 10 |
| 02 | (I) | i. මව් පියන්ගේ යහපත් අරමුණු ඉටුකිරීම වෙනුවෙන් කැපවීම.<br>ii. තරුණ වියෙහිදී ම චාම් සරල දිවියකට හුරුවීම.<br>iii. තමන්ට පැවරෙන වගකීම් නිසි ලෙස ඉටුකිරීම.<br>iv. අනුන්ගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට හුරු වීම.<br>v. තමන් ආරම්භ කළ ක්‍රියාව ප්‍රතිඵල ලැබෙනතුරු කරගෙන යාම.<br>vi. අනුන්ගේ දියුණුව වෙනුවෙන් කාලය, ධනය, ශ්‍රමය කැපකිරීම.<br>vii. බුදුසසුනේ දියුණුව හා සමාජයේ දියුණුව වෙනුවෙන් කැපවී ක්‍රියා කිරීම | 67<br>68 | 05<br>01 | 05 |
| | (II) | දෙවන පැතිස් රජ සමයේ ලක්දිවට වැඩම කිරීම. රජතුමාට ධර්මය හඳුන්වා දීම, රාජ්‍ය ආගම බවට බුදු දහම පත්කිරීම, මෙරට භික්ෂු ශාසනය ආරම්භ කිරීම, අවස්ථාවට හා පුද්ගලයන්ට ගැලපෙන ආකාරයේ ධර්ම දේශනා සිදුකර රාජකීයයන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ප්‍රඥාව දියුණු කරවීම, මෙරට ජනතාවගේ විමුක්තිය සඳහා කටයුතු කිරීම, සංඝමිත්තා තෙරණිය ගෙන්වා ගෙන මෙරට භික්ෂුණී ශාසනය ආරම්භ කිරීම, වෙහෙර විහාර ගොඩනැංවීමට අවශ්‍ය උපදෙස් දීම, ප්‍රාථමික ඇදහිලි හා විශ්වාස වෙනුවට බෝධි වන්දනා, චෛත්‍ය වන්දනා ආදිය හඳුන්වා දීම, මලවුන් පිදීම වෙනුවට දෙවියන්ට හා ඥාතීන්ට පිං දීම හඳුන්වා දීම, ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වඩමවා දීම,<br>*(ඉහත කරුණු හා තම උගත් අතිරේක කරුණු ද ඇතුළත් කර සපයා ඇති ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 10 ක් ලබා දෙන්න)* | 66<br>67 | | 10 |
| 03 | (I) | 1. තණ්හාය අසේස විරාග නිරෝධෝ - තණ්හාව ඉතිරි නොකොට නැතිකිරීම.<br>2. චාගෝ - තණ්හාව දුරුකිරීම.<br>3. පටිනිස්සග්ගෝ - තණ්හාව බැහැර කිරීම.<br>4. මුත්ති - තණ්හාවෙන් මිදීම.<br>5. අනාලයෝ - තණ්හාව පිළිබඳ ඇල්මක් නොවීම<br>*(අර්ථය පමණක් ලියා ඇතත් ලකුණු 05 ක් ලබා දෙන්න)* | 38 | 04 | 05 |
| | (II) | ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක<br><br>1. කොසොල් රජුගෙන් අසදෘශ මහා දානයක් ලැබූ බුදුරජාණන් වහන්සේට වේරඤ්ජාවේ දී යව සහලින් යැපෙන්නට සිදුවීම.<br>2. සේල බමුණා වැනි අන්‍යාගමිකයන් බුදු ගුණ වයමින් කීර්ති ඝෝෂා පැවැත්වීම. | 44<br>45 | | 10 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 3. චිංචි මානවිකා, මාගන්ධියා, සුන්දරී පරිබ්‍රාජිකා වැනි කාන්තාවන් නිසා බුදුරජාණන් වහන්සේට නින්දා අපහාස විඳින්නට සිදුවීම.<br>4. දෙව්දත් විසින් පෙරළූ ගලෙන් කැබැල්ලක් වැදී බුදු ශ්‍රී පතුල තුවාල වීම, පිරිණිවන් පෑමට ආසන්න සමයේ ලෝහිත පක්ඛන්දිකා රෝගය වැළඳීම නිසා පීඩාවට පත්වීම.<br>*(අට ලෝ දහම් නමකර කෙටියෙන් හඳුන්වා අවස්ථා හතරක් දක්වා ඇතිනම් ලකුණු 10 ක් ලබා දෙන්න)* | | | |
| | (I) | ධර්මය හා විනය ගැන මතවාද ගොඩනැගී තිබීම.<br>එකම සඟ පරපුර මහා විහාර, අභයගිරි, ජේතවන වශයෙන් නිකාය තුනකට බෙදී යාම.<br>ශාසනයට නිසි මග පෙන්වන්නෙකු නොවීම.<br>සමහර භික්ෂූන් ජීවත්වීම උදෙසා නොගැලපෙන ක්‍රියාවන්ට යොමුවී තිබීම.<br>සතර වන මිහිඳු රාජ සමයෙන් පසු අනුරාධපුර රාජධානිය පිරිහී සොළී, කේරළ, කර්ණාටක ආදී පර සතුරු ආක්‍රමණ නිසා වසර 70 ක පමණ කාලයක් රට අරාජිකව පැවතීම හේතුවෙන් රාජ්‍ය අනුග්‍රහයක් නොවීම. | 50 | 01 | 05 |
| 04 | (II) | පළමුවන විජයබාහු රජතුමා<br>i. භික්ෂූන් වහන්සේලාට ත්‍රිපිටකය පුරුදු පුහුණු කරවීමට පහසුකම් සැලසීම.<br>ii. ධර්ම ශාස්ත්‍ර නගාසිටුවීම සඳහා ත්‍රිපිටක ව්‍යාඛ්‍යාන ලිවීම.<br>iii. ධර්මය කියාදෙන්නන්ට හා ධර්ම ග්‍රන්ථ රචනා කරන්නන්ට විවිධ සංග්‍රහ කිරීම.<br>iv. රජතුමා ද ධර්ම ග්‍රන්ථ ලිවීම.<br>v. භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් නොඅඩුව සපයා දීම.<br>vi. දළදා පූජාව නැවත ආරම්භ කර ශක්තිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සැලසීම.<br>vii. භික්ෂූන් වහන්සේලා හා ශාසන චාරිත්‍ර පිළිබඳ බලවත් ලැදියාවකින් කටයුතු කිරීම.<br>viii. දූරබැහැර පිහිටුවා තිබූ සිද්ධස්ථානවල ද දියුණුවට කටයුතු කිරීම.<br><br>මහා පරාක්‍රමබාහු රජතුමා<br>i. පොළොන්නරු කතිකාවත සකස් කරවීම.<br>ii. සංඝරාජ පදවිය ඇතුළු ශාසනික පදවි පිරිනැමීම.<br>iii. බෞද්ධ ග්‍රන්ථ සුලභ කිරීම<br>iv. බුරුම රජතුමා සමග ආගමික සම්බන්ධතා සහ මිත්‍ර සම්බන්ධතා තහවුරු කරගැනීම.<br>v. රාජ්‍ය පාලකයාට අනුශාසනා උපදෙස් හා අවවාද ලබා දීමට තරම් භික්ෂූන් වහන්සේ ප්‍රබල තත්වයට පත් කිරීම.<br>vi. බුරුම භික්ෂූන් වහන්සේලා ඉගෙනීමේ කටයුතු සඳහා ලක්දිවට වැඩම කරවීම. | 50 - 52 | | 10 |
| | (I) | 1. දාගැබ වහන්සේ - ශාරීරික චෛත්‍යය<br>2. බෝධීන් වහන්සේ - පාරිභෝගික චෛත්‍යය<br>3. බුදු පිළිමය - උද්දේසික චෛත්‍යය<br><br>"යස්ස මූලේ නිසින්නෝව - සබ්බාරි විජයං අකා" ගාථාව<br>හෝ<br>"ඉමේ ඒතේ මහා බෝධි - ලෝකනාථෙන පූජිතා" ගාථාව<br>හෝ<br>බෝධි වන්දනාව සඳහා යොදාගන්නා ගාථාවක් සඳහන් කර ඇත්නම් ලකුණු 05 ක් ලබා දෙන්න | 55 | 01 | 05 |
| | (II) | සිසුන් විසින් ඉදිරිපත් කර ඇති සාර්ථක යෝජනා එකකට ලකුණු දෙක බැගින් ලබා දෙන්න. | | | 10 |

Scanned by TapScanner

## III - කොටස

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 06 | (I) | i. | අවසර, ස්වාමීනි, මම තිසරණ සහිත පංචශීලය ඉල්ලමි. ස්වාමීනි, මට අනුග්‍රහ කොට සිල් දෙන්න. | 59 | 01 | 05 |
| | | ii. | භාග්‍යවතුන් වහන්සේ ධර්මය මනාව දේශනා කරන ලද්දේය. (ඒ ධර්මය) තමා විසින් ම දැකිය යුත්තේ ය. කල් නොයවා විපාක ගෙන දෙන්නේ ය. මෙහි එව, මේ ධර්මය බලව යන ආකාරයට කීම සුදුසු ය. තමාගේ සිතට පමුණුවා ගැනීමට සුදුසු ය. නුවණැත්තන් විසින් තම තමා වෙන වෙනම දතයුතු ය. | 62 | 01 | |
| | (II) | i. | ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං අට්ඨංග සීලං ධම්මං යාචාමි. | 60 | 04 | 10 |
| | | ii. | භන්තේ, ත්වං මේ අනුග්ගහං කත්වා සීලං දේථ. | 61 | 01 | |
| | | iii. | මයං භන්තේ, දස සීලං ධම්මං යාචාම. | 60 | 04 | |
| | | iv. | ධම්මෝ ඕපනයිකෝ. | 60 | 01 | |
| | | v. | භගවා දේසිතෝ ධම්මෝ විඤ්ඤූහි වේදිතබ්බෝ | 63 | 01 | |